# බෙර හඬ නාට්‍යය

සම්භාව්‍ය ග්‍රීක නාට්‍ය රචක සොෆොක්ලීස්ගේ "ඉක්නෙවුටායි" නම් නාට්‍යය, ඇසුරෙන් වර්ෂ 1961 දෙසැම්බර් 21 දින මුල් වරට වේදිකා ගත වූ "බෙර හඬ" නාට්‍ය ප්‍රවීණ නාට්‍යවේදී බන්දුල ජයවර්ධනයන් ගේ නිර්මාණයකි.

ගීත නාටක ශෛලිය ට අනුව නිර්මාණය වූ මෙම නාට්‍යයට එම ආකෘතිය ලැබී ඇත්තේ, මෙහි මුල් නාට්‍යයද ඔපෙරා ආභාසයට නිර්මාණය වූ නාට්‍යයක් නිසා ය.

මෙහි සංගීත නිර්මාණය ප්‍රවීණ සංගීතඥ ඔස්ටින් මුණසිංහයන් විසින් නිර්මාණය කොට ඇත.

පසු කලෙක ලූෂන් බුලත්සිංහල විසින් බෙරහඬ නව නිෂ්පාදනයක් ලෙස වේදිකාගත කරන ලදී .

ඔහු විසින්ම පසු කලෙක රූපවාහිනී සඳහා කොටස් වශයෙන් මෙම නාට්‍යය නැවත නිර්මාණය කරන ලදී.

රූපවාහිනි නිෂ්පාදනය සඳහා ග්‍රැන්විල් රොද්‍රිගු, ජැක්සන් ඇන්තනි, රොඞ්නි වර්ණකුල, ගාමිණී සමරකෝන් වැනි ශිල්පීන් ද සම්බන්ධ විය.

ශ්‍රී ලංකාවේ ජනතාව වෙනුවෙන්, ග්‍රීක දේශයේ නාවික වෙළඳුන් විසින් , මිත්‍රශීලී සුහදතාවකින් හා ලෙන්ගතුකමින් , පුදනු ලැබූ නාට්‍යයක් ලෙස බෙරහඬ නාට්‍ය හැඳින්විය හැක.

ග්‍රීක නාට්‍ය ඇසුර ලබා ගත්තද ඔස්ටින් මුණසිංහ සංගීත ශිල්පියා විසින් දේශීයත්වය ඊට ඇතුළත් කරමින් ඉතා මනරම් සංගීත රටාවන් මුසු කර ඇත්තේ මෙය අපේම ජන නාට්‍යයක් යැයි හැඟෙන අයුරිනි.

විශිෂ්ට නාට්‍ය නිෂ්පාදකයකු වූ බන්දුල ජයවර්ධන ඉතා මැනවින් මෙම කතා පුවත දේශීය සම්ප්‍රදායට ගැළපෙන ලෙස ගොඩනඟා ගොඩ නගා ඇති අයුරු අපූර්ව ය .

රංග වස්ත්‍ර වලින්  අල්ප වශයෙන් ග්‍රීක නාටක ආභාසය ලබා ඇති බව පෙන්නුම් කෙරේ.

පහත දැක්වෙන්නේ මෙම නාට්‍යයේ ඉතා ම ජනප්‍රිය ගීතයකි. පහත රට බෙර ගැන සංගීත නාද රටා ඇසුරු කර ගෙන මෙම ගීතය නිර්මාණය කර ඇති බව ගීතයේ සංගීතය දෙස බැලීමේදී අපට පෙනී යයි .

නාට්‍යය - බෙර හඬ

ගායනය - රොඩ්නි වර්ණකුල

[හනික වරෙව් කොල්ලනේ

මෙන්න මෙහෙ වරෙව්]//

[මෙන්න මෙහෙ වරෙව් කොල්ලනෙ

නට නටා වරෙව්]//

[තොපිට හරිම වාසියක්

නට නටා වරෙව්]//

[හනික වරෙව් කොල්ලනේ

මෙන්න මෙහෙ වරෙව්]//

[මෙන්න මෙහෙ වරෙව් කොල්ලනෙ
නට නටා වරෙව්]//
තොපිට හරිම වාසියක්
නට නටා වරෙව්..යකෝ
තොපිට හරිම වාසියක්
නට නටා වරෙව්

[වැඩේ අමාරුත් නැතේ
තෑගි ටිකත් අපි අතේ]//
[රත්තරනින් එවන්නේ
හිරු දෙවියොයි කියන්නේ]////

[මෙන්න මෙහෙ වරෙව් කොල්ලනෙ
නට නටා වරෙව්]//
තොපිට හරිම වාසියක්
නට නටා වරෙව්..යකෝ
තොපිට හරිම වාසියක්
නට නටා වරෙව්
[හනික වරෙව් කොල්ලනේ
මෙන්න මෙහෙ වරෙව්]//

[සාදු සාදු කියල්ලා
ප්‍රීති ඝෝෂ කරල්ලා]//
හිරු දෙවිඳුගෙ ගොපල්ලෝ
කන්ද උඩින් වරෙල්ලා
හිරු දෙවිඳුගෙ ගොපල්ලෝ
කන්ද යටින් වරෙල්ලා

[හිරු දෙවිඳුගෙ හරක් ගත්තු
හරක් හොරා හොයල්ලා]//
[ලෝකෙ වටේ ගොහිල්ලා
හරක් හොරා හොයල්ලා]//
[හිරු දෙවිඳුගෙ හරක් ගත්තු
හරක් හොරා හොයල්ලා....]//
වනන්තරේ සොයාපියෝ
ගල් අරඹේ සොයාපියෝ
මරු කතරේ සොයාපියෝ
මිනිස් වාසෙ සොයාපියෝ
[කඳු මුදුනේ ගං ඉවුරේ
වනන්තරේ සොයාපියෝ]//
[හිරු දෙවිඳුගෙ ගොපල්ලො අපි
අපිට දෙවියො බලාපියෝ....]//
[රන් අඹරණ පැළඳගත්ත
මහ පොළොවේ රන් වපුරන]//
අපිට දෙවියො බලාපියෝ///
[හරක් හොරා හොයාගන්න
සියලු දෙවියො පිහිටවෙයෝ....]//

**<u>ඇමුණුම්</u>**

හනික වරෙව් ගීතය
https://youtu.be/hIucrA1WWQ4

නාට්‍යයේ ජවනිකාවක්
https://youtu.be/bkWwHs89kKg

අමතර කියවීම සඳහා
http://archives.sarasaviya.lk/2016/09/15/?fn=sa16091537

පැවරුම

- පෙර සතියේ පාඩමේ අවසානයට මෙම සටහන ද පොතෙහි සටහන් කර ගන්න.
- නාට්‍ය වල තොරතුරු මතකයේ තබා ගන්න.
- ගීතයේ ස්වර ප්‍රස්තාරය සටහන් කරගෙන වාදනය කිරීමට පුහුණු වන්න.
- ගීතය ගායනය පුහුණු වෙමින් පද මාලාව මතකයේ රඳවා ගන්න.